ජයතිලක, ජේ.ඒ. වජිර නලින්ද

ඉතිහාසය හා කලා සිද්ධාන්ත අධ්‍යනාංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*Paper: Transformability*

# යටත් විජිතකරණය සහ බෞද්ධ සැරසිලි කලාව (ක්‍රි.ව.1750-1900).

ශ්‍රී ලංකාව අපරදිග යටත් විජිතකාරක ග්‍රහණයට නතුවීමේ ප්‍රතිඵලයක් ලෙස බෞද්ධ සැරසිලි කලාවේ වැදගත් වෙනස්කම් රැසක් සිදු වූ බව හඳුනා ගත හැකිය. විශේෂයෙන්ම ලන්දේසි හා ඉංග්‍රීසි කාල පරිච්ඡේදයන්හි පහතරට වෙරළබඩ තීරයේ ඉදි කෙරුණ විහාරස්ථානවල මෙම ලක්ෂණය හොඳින් දක්නට ලැබේ. සාම්ප්‍රදායික බෞද්ධ කලාවේ ප්‍රචලිත ව පැවති ලියවැල්, නෙළුම් මල්, පලා-පෙති, සපුමල්, කඩුපුල් මල් ආදී මෝස්තරාංග වෙනුවට මිදිවැල්, මිදි පොකුරු, රෝස මල්, සහ බැරොක්-රොකෝකෝ වැනි අපරදිග මූලයන් සහිත සැරසිලි විශාල ප්‍රමාණයක් බෞද්ධ කලාවට එක් වී තිබේ. මෙසේ යටත් විජිත කාලපරිච්ඡේදයේ දී බෞද්ධ සැරසිලි කලාංගයන්හි සිදු වූ වෙනස්කම් මොනවාද ඒ සඳහා බලපෑ සමාජ දේශපාලන සාධක කවරේද යන්න මෙම අධ්‍යයනයෙන් පරීක්ෂා කෙරිණි. යට සඳහන් අපරදිග මෝස්තරවලට අමතර ව උඩරට මධ්‍යම මහනුවර ගුරු කුලයේ දක්නට නොමැති නව සැරසිලිමය සත්ත්ව රූප වන කඟවේණා, සමනලයින්, කෘමි සතුන්, ස්වභාවිකරූපී පක්ෂීන් ආදීන් පහතරට බෞද්ධ සැරසිලි කලාවේ භාවිත කර ඇත. කතළුව පූර්වාරාමය, කරගම්පිටිය සුබෝධාරාමය, පානදුර රන්කොත් විහාරය, සපුගොඩ ශ්‍රීමහා විහාරය ආදිය මෙබඳු මෝස්තර සහිත ස්ථාන සඳහා නිදසුන් ය. එසේම විහාරවල ජනේල සහ දොරටුවලට ඉහල වා-කවුළු මෙන් ම සිතුවම්වල පසුබිම්-අවකාශ පිරවීමට ද බැරොක-රොකෝකෝ සම්ප්‍රදායේ ආභාසය සහිත පත්‍ර රටා භාවිතා කර තිබේ. මීට අමතරව යුරෝපීය රාජ්‍ය ලාංඡන දොරටු සැරසිල්ලක් ලෙස බොහෝ පහතරට විහාරස්ථානවල යෙදී තිබේ. වර්ණ ගැන්වූ වීදුරු සවිකර ජනේල අලංකාර කිරීම මෙකල ජනප්‍රිය වූ තවත් වැදගත් සැරසිලි ක්‍රමවේදයකි. එසේම පිගන් ගඩොල් අල්ලා කළ මොසෙක් ක්‍රමයේ සැරසිලි කලාව ද ප්‍රමුඛ සැරසිලි ක්‍රමයක් බවට පත් විය. අපරදිග අනංග රූප ද අවකාශ පිරවීමේ සැරසිල්ලක් වී තිබෙන ආකාරය සපුගොඩ ශ්‍රී මහා විහාරයෙන් හඳුනා ගත හැකිය. ඉංග්‍රීසි අක්ෂර ද සැරසිලිමය අරුතින් දොරටු ඉහළින් යෙදුණු අවස්ථා හමු වේ. මෙසේ බෞද්ධ නොවූ මූලයන් සහිත සැරසිලි රැසක් යටත්විජිත සමයේ බෞද්ධ සැරසිලි කලාවට පිවිසී ඇති අතර ඊට කාරණා ගණනාවක් බල පා ඇති බව හඳුනා ගත හැකිය. විහාර සැලසුම්කරුවන් සහ කලා ශිල්පීන් ජීවත් වූයේ යුරෝපීයයනට සමාජ මෙන්ම දේශපාලනික අධිකාරිත්වය හිමි වූ සමාජ අවකාශයක වීම මේ අතරින් කැපී පෙනේ. යටත් විජිතකාරකයන් අපරදිග රුචිකත්ව සහිත සැරසිලි අංග හැමවිට ම උත්කෘෂ්ඨත්වයෙන් සැලකූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය සැරසිලි අංග නොසලකා හැරුණි. දේශපාලනික අධිකාරිත්වය නිසා අපරදිග සැරසිලි සහිත ගොඩනැගිලි තැනීම, විදේශීය සිත්තරුන් පැමිණීම, විවිධ අපරදිග ව්‍යවහාරක කලා පැතිරී යාම ආදියද සිදු වූහ. එසේම පහතරට විහාරාරාම ඉදිකිරීම සඳහා සිංහල රාජ්‍ය අනුග්‍රහය වෙනුවට යටත් විජිත පාලනයේ තනතුරු දැරූ නව දේශීය අනුග්‍රාහකයින් ඉදිරිපත් විය. මෙම අනුග්‍රාහකයින්ගෙන් බහුතරය මිෂනාරි අධ්‍යාපනය ලැබූ යුරෝපීය හර පද්ධතීන් ප්‍රිය කළ පිරිසක් වූ බව ඔවුන්ගේ නිවාස සහ නිවාස සැරසිලිවලින් තහවුරු වේ. පහත රට ඇතැම් විහාර ශිල්පීන් ද යටත් විජිත ගොඩනැගිලි, පල්ලි, පාසල් ආදිය තැනීමට මෙන්ම විවිධ සැරසිලි කටයුතුවලට වක්‍ර ව සම්බන්ධ වූ බවට සාධක හමු වේ. මෙම යටත්විජිත දේශපාලනික හා සාමාජීය වෙනස්කම් බෞද්ධ සැරසිලි කලාවේ ස්වරූපය වෙනස්වීමට හේතු වූ බව හඳුනා ගත හැකි ය.

**මූල පද:- දෘශ්‍ය කලාව/ බෞද්ධ සැරසිලි කලාව/ යටත්විජිත සමය**